සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **සිංහල සාහිත්‍ය රසාස්වාදය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **I** කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) 'එසේ වී නම් පටවා ලූ බරත් හැර ගෙන මෙතෙක් කල් යා අටවිසි ගවුවට අනෙක් අටවිසි ගවුවකුත් පිට ලා ලා ස පණ ගවුවක් යෙමි.'

(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුද? කා හට ද?

(ආ) මෙහි එසේ වී නම් ... යනුවෙන් කියන්නට හේතු වූ කරුණ කුමක් ද?

(ii) 'අනේ කවුද දන්නේ සමහරු කියන්නේ සන්නිපාත උනෙයි කිලයා දවස් තුනක් ඉස්පිරිතාලේ හිටියා.. ඒත් මැරුණා.'

(අ) ඉහත ප්‍රකාශය කළේ කවුද?

(ආ) ප්‍රකාශය ඇතුළත් කෘතියේ රචකයා නම් කරන්න.

(iii) නො හිමි සුවඳ විහිදෙන කස්තුරි නිමල
උතුම් මුව නැබෙහි තැබි බඹ නැණ විකල
විනම් මෙ මට මහ බඹු පදවි යටි කල
තබමි බොරු කියන දුදන්ගෙ දිව මුල

(අ) කවියේ මුල් පද දෙකෙහි අදහස ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියා දක්වන්න.

(iv) "දේවයන් වහන්ස, දිව්‍ය අප්සරාවන් සමාන රූප ශෝබා ඇති නුඹ වහන්සේගේ දූන් සත්දෙනා මෙරජ දරුවන්ට පාවා දී මුන් හැම බැණ කොට ගත මැනැවැ" යි කිවූ ය.

(අ) මෙහි දේවයන් වහන්ස යනුවෙන් ආමන්ත්‍රණය ලබන්නේ කවුද?

(ආ) ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?

(v) පෙරදිග ගොරහැඬි රකුසෝ
මගේ ධනය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ

(අ) කවි පෙළ රචනා කළ කවියාගේ නම ලියන්න.

(ආ) 'කලු රෙදි පොට' යනුවෙන් අදහස් කළේ කුමක් ද? (ලකුණු 4 × 5 = 20)

(2) පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කර ගෙන රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්ද මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙම පන් පැදුරට උණු කඳුලක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුනවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(i) මෙම කවි පෙළට වස්තු විෂය වී ඇත්තේ කුමක් ද?

(ii) කවියා මේ සඳහා යොදාගෙන ඇති ආකෘතිය අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා කොතෙක් දුරට උචිත වන්නේ ද?

(iii) කවි පෙළ තුළින් ඔබ හඳුනා ගන්නා කාව්‍යෝපක්‍රම දෙකක් නම් කර ඒ සඳහා උදාහරණ දක්වන්න.

(iv) කවියා උපයුක්ත කරගෙන අති භාෂාව රස නිෂ්පත්තියට කොතෙක් දුරට ගැළපේ ද?

(v) 'කවි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි.' ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 5 × 5 = 25)

## II කොටස

03 පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

ඒ මල් කරුවා ද බෝධිසත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා රූ නගා කරන ලද මල්සුඹුල උන්ටම දුන්නේ ය. ප්‍රභාවතී ද ඒ මල් සුඹුලෙහි කුස රජ්ජුරුවන්ගේ හා තමන්ගේ හා නොයෙක් රූ දැක කුස රජ්ජුරුවන් කළ බව දැන කිපී බිමට දමුව තෙසු නගු පෙර පරිද්දෙන් ම වෙහෙසූ ය. මල්කරුවා ද මසු දහස ගෙනගොස් බෝධිසත්ත්වයින්ට දී එපවත් කීයේ ය. බෝධි සත්වයෝ "මෙයින් මට අස්ථානය" යි ඒ රන් ඕහට දී එතනින් රජ්ජුරුවන්ගේ අරක්තැමියා කරා ගොස් ඕ හට අතවැසිව දවසක් අරක්කැමියා රජ්ජුරුවන්ට මේ වඩාගෙන යමින් තමහට පිසන පිණිස බෝධිසත්ත්වයින්ට ඇටමුසු දඩමසක් දීලා ගියේ ය. බෝධිසත්ත්වයෝ ද ඒ ඇටය පිස මුළු නුවර සුවඳ පැතිරෙන සේ දුම්කරවූ හ. එසඳ රජ්ජුරුවෝ සුවඳ අසා "කිමෙක් ද, මුළුතැන් ගෙයි අනිත් මාළුවකුත් පිසත්ද" යි විචාරා අරක්කැමියා විසින් "දේවයන් වහන්ස, අනිත් පිසින මාළුවක් නැත්තේ ය. එතකුපුවත් ඇටමුසු මසක් අප ඇමට පිසින ලෙස අතවැස්සාට දීලා ආමියි, එහි සුවඳ විය යුතු ය." යී කී සඳ රජ්ජුරුවෝ ඒ ගෙන්වාගෙන ඉන් සුගක් අනුභව කොට බැලූ ය. එකෙණෙහි එහි රස සත්සියයක් පමණ රස නහරවල පැතිර සිටියේ ය. රජ්ජුරුවෝ ඒ රස තෘෂ්ණාවෙහි බැඳී ඕ හට මස්සෙන් දහසක් දී "මෙතැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවන්ටත් බත් මාළු පිස මා දරුවන්ට ඔහු විසින් ගෙන දෙන්ට ක්යව, තෝ අපට ගෙනෙව" යි නියෝග කළේ ය.

(i) ඡේදයෙහි සඳහන් වන ආකාරයට බෝධිසත්වයන්ගේ අරමුණ වන්නේ කුමක් ද? (ල. 05)

(ii) ප්‍රභාවතී මල් සුඹුල බිම දමන්නට හේතුව කුමක් ද? (ල. 05)

(iii) ඡේදයෙහි දැක්වෙන ආකාරයට කතුවරයාගේ භාෂාව හැසිරවීමේ දක්ෂතා දෙකක් නිදසුන් මගින් ඉදිරිපත් කරන්න. (ල. 05)

(iv) ඡේදයට අනුව කුස රජ්ජුරුවන්ගේ චරිතයෙහි යහපත් ලක්ෂණ පිළිබඳව විමසන්න. (ල. 10)

<u>නැතහොත්</u>

මඟක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මඟක් ම යි
අතර මඟ ළත නොවී
මුව දොර සොයා යන
ගඟක් ම යි

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

මඟකට දොසක් නොකියන්
නැත ඊට නිසි කාරණා
අම්බලම්
විසිතුරු සල්පිලෙන්
පිට රවුම්
පදිනා මල් වැටෙන්
සෙවණලු සඳහා
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා
මඟක් නම්
ඒ මගක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

(i) කවියා දක්වා ඇති ආකාරයට මඟක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 05)

(ii) කවි පෙළ සඳහා යොදා ගෙන ඇති කාව්‍යෝපක්‍රම දෙකක් නිදසුන් මගින් හඳුන්වන්න. (ල. 05)

(iii) කවි පෙළට වස්තු විෂය වන අත්දැකීම ඉදිරිපත් කිරීමට යොදාගත් ආකෘතිය පිළිබඳ ඔබේ අදහස කුමක් ද? (ල. 05)

(iv) කවි පෙළෙන් කවියා ඉස්මතු කෙරෙන ජීවන දෘෂ්ටිය පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 10)

## III කොටස

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න. පිළිතුරට වචන 150ක් වත් තිබිය යුතු ය.

04 ගැඹුරු දහමක් වුවද රසවත් කතන්දරයක් ආකාරයට ඉදිරිපත් කිරීමට සද්ධර්මරත්නාවලි කතුවරයා දක්වන්නේ මහත් කුසලතාවයකි.නන්ද වස්තුවෙන් නිදසුන් තුනක්වත් ගෙන විමසන්න. (ල. 15)

05 අර්ථ රසය හා භාවාත්මක හැඟීම් මතුවන ආකාරයට සජීවී දෙබස් නිර්මාණය කර තිබීම "වැලපීම" කෙටි කතාවේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය නිදසුන් තුනක්වත් ගෙන පැහැදිලි කරන්න. (ල. 15)

06 ගැමි ජනයාගේ සුන්දර ජීවිතයෙහි ඇතුළත් අව්‍යාජ ලක්ෂණ ජන කවියෙන් මනාව ඉස්මතු කෙරෙයි. නිර්දිෂ්ට කවි වලින් නිදසුන් ගනිමින් විමසීමක් කරන්න. (ල. 15)

07 තත්කාලීන ගැමි පරිසරයේ සමාජ ආර්ථික රටාව තුංමං හන්දිය නවකතාවෙන් මනාව හෙළි කරයි. නිදසුන් තුනක්වත් ගනිමින් පැහැදිලි කරන්න. (ල. 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 (i) (අ) කොටළුවා වෙළෙන්දා හට
(ආ) රුපන් කොටළු දෙනක පාවා දෙනවා යයනි කීම.

(ii) (අ) ඉයෝනා
(ආ) ඇන්ටන් චෙකෝෆ්

(iii) (අ) අප්‍රමාණව සුවඳ විහිදෙන්නා වූ පිරිසිදු කස්තුරි මුවාගේ පෙණයෙහි තැන්පත් කරන ලද්දේ මහා බ්‍රහ්මයා සිහි විකල්ව සිටි වේලාවක ය.
(ආ) නාඹිය (පෙකණිය) (ඉතා පිරිසිදු)

(iv) (අ) කුස රජතුමා
(ආ) පන්සිය පනස් ජාතක පොත

(v) (අ) සිරි ගුණසිංහ මහතා
(ආ) රාත්‍රී කාලයේ ඇති අඳුර (ල. 4 x 5 = 20)

02 (i) සංවර්ධන ව්‍යාපෘති නිසා ස්වාභාවික වනාන්තර ආදිය විනාශ වී ගම කාන්තාරයක් බවට පත්වීම. (ල. 05)
(ii) සඳැස් ආකෘතිය දොයාගෙන ඇත. (ල. 05)
(iii) (එළිසමය/ ව්‍යංග්‍යාර්ථය/ රූපක / සංකේත (ල. 05)
(iv) සරල භාෂාව, රූපකාර්ථවත් භාෂාව, ව්‍යංගාර්ථවත් භාෂාව (ල. 05)
(v) වර්ථමානයේ අධිවේගී මාර්ග, නගර සංවර්ධනය වැනි සංවර්ධන ක්‍රියා මාර්ග නිසා කවියෙන් කියවෙන දේ දක්නට ලැබීම. (ල. 05)

## II කොටස

03 (i) කෙසේ හෝ ප්‍රභාවතිය දකින බලාපොරොත්තුව. (ල. 05)
(ii) මෙය කුස රජ්ජුරුවක් නළ බව දැන ගැනීම. (ල. 05)
(iii) අදාළ චරිතවලට අවස්ථාවට ගැළපෙන සේ දෙබස් හා සංවාද යොදා තිබීම. (ල. 05)
(iv) නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම.
ඉතාම දක්ෂයෙකු ලෙස කාර්යයන්හි නියැලීම (ල. 10)
නැතහොත්
(i) පියවර මතින් තැනූ බව
මංසන්ධි හමුවීම
කුඩා වීථි දක්නට ලැබීම (ල. 05)
(ii) ව්‍යංග්‍යාර්ථ
සංකේත භාවිතය (ල. 05)
(iii) නිදහස් කාව්‍යය ආකෘතිය යොදාගෙන තිබේ.
අත්දැකීම් ඉදිරිපත් කිරීම සඳහා මෙම ආකෘතිය වඩාත් උචිත බව කරුණු දක්වමින් පැහැදිලි කළ යුතු ය. (ල. 05)
(iv) මිනිස් ජීවිතය නොනවතින ගමනක් බව මග කවි පෙළ තුළින් දාර්ශනිකව ඉදිරිපත් කර ඇත. ජීවන ගමන ද එක් නවාතැනක් බවද කවියා ප්‍රකාශ කරයි. (ල. 10)

## III කොටස

04 ගැඹුරු දහම් කරුණු ගැමියන්ට අවබෝධ කරගැනීමට පහසු කරවීමත් ඒවා ඉතාම රසවත් ආකාරයට ඉදිරිපත් කිරීමටත් ධර්මසේන හිමියන් දක්වන්නේ මහත් ප්‍රතිභාවකි. මේ සඳහා උන්වහන්සේ විවිධ රචනා උපක්‍රම යොදා ගෙන තිබේ.

උදා:- ගැමි පරිසරයෙන් ගත් උපමා, ප්‍රස්ථාව පිරුළු බහුලව යොදා ගැනීම.
හාස්‍ය හා උපහාස රසය කතාවලට ඇතුළත් කර තිබීම. (ල. 15)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

05 අර්ථ රසය හා භාවාත්මක හැඟීම් ඉස්මතුවන ආකාරයට සජීවී දෙබස් හා සංවාද චරිතවලට ඇතුළත් කර තිබීම වැලපීම් කෙටිකථාවේ ලක්ෂණයකි. මේ සඳහා උදා. දී ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න. (ල. 15)

06 ජන කවියෙන් මතුවන ගැමි ජීවිතයේ අව්‍යාජ ලක්ෂණ කීපයක් උදා. ගෙන විස්තර කළ යුතුයි.
පැල් රැකීම හා සම්බන්ධ සුන්දර මතකයන් හේන රැකීමේදී ගොවියා මුහුණදෙන දුන්, කරදර හා ඔහු දුප්පත්කම නිසා ම පැල් රකින බව අව්‍යාජව ප්‍රකාශ කිරීම. (ල. 15)

07 තුංමංහන්දිය ලියවුණ කාලයේදී ගැමි පරිසරයේ දක්නට ලැබූ සමාජ ආර්ථික රටාව නවකතාව තුළින් නිරූපණය වන අවස්ථා කීපයක් පිළිතුරෙහි ඇතුළත් විය යුතු ය.
උදා: මගුල් ගෙදරකට ගැමියන් සූදානම් වූ ආකාරය
මගුල් මඩුව සකස් කිරීම
සාමූහිකව කටයුතු කිරීම
සුදුව, බීමත්කම, ගැමි පරිසරයේ දක්නට ලැබූ බව (ල. 15)